# ලංසු සඳහා ආරාධනයයි.
## අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
## සබරගමුව පළාත් සභාව.

සබරගමුව පළාත් පාසල් සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණික උපකරණ හා දහම් පාසල් සඳහා පුස්තකාල කබඩ් සැපයීමට සුදුසුකම් හා හැකියාව ඇති ලංසුකරුවන්ගෙන් සබරගමුව පළාත් සභාවේ අධ්‍යාපන , තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ජාතික තරඟකාරී ලංසු කැඳවීම (NCB ) යටතේ මිල ගණන් කැඳවනු ලැබේ.

**Package No – 01 පරිගණක උපකරණ සැපයීම.**

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | ලංසු සුරක්ෂණ ඇපකරය ( ශ්‍රී ලංකා රු.) | ආපසු නොගෙවන තැන්පතු මුදල ( ශ්‍රී ලංකා රු.) |
|---|---|---|---|---|
| 01 | ඩෙස්ක්ටොප් පරිගණක යන්ත්‍ර | 210 | 500,000 | 6000 |
| 02 | පරිගණක මුද්‍රණ යන්ත්‍ර ( Printers ) | 210 | 84,000 | |
| 03 | අඛණ්ඩ බල සැපයුම් යන්ත්‍ර 650 VA ( UPS ) | 210 | 15,000 | |
| | එකතුව | | 599,000 | |

**Package No – 02 දහම් පාසල් සඳහා පුස්තකාල කබඩ් සැපයිම.**

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | ලංසු සුරක්ෂණ ඇපකරය ( ශ්‍රී ලංකා රු.) | ආපසු නොගෙවන තැන්පතු මුදල ( ශ්‍රී ලංකා රු.)) |
|---|---|---|---|---|
| 01 | පුස්තකාල කබඩ් (වානේ ) | 145 | 65,000 | 3500 |
| | එකතුව | | 65,000 | |

**01.මෙම ප්‍රසම්පාදන දැන්වීම [www.sg.gov.lk](http://www.sg.gov.lk) වෙබ් අඩවිය තුළ ඇති ටෙන්ඩර් දැන්වීම් වෙබ් පිටුව වෙත ගොස් හෝ [www.moe.sg.gov.lk](http://www.moe.sg.gov.lk) යන අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් පිටුවට පිවිස ලබාගත හැකිය.**

**02.** ඉහත ප්‍රසම්පාදන ලේඛන **2025.08.15** දින සිට **2025.09.04.** දින දක්වා, සතියේ වැඩ කරන දින වල **<u>පෙ.ව. 9.00 සිට ප.ව. 3.00</u>** දක්වා අදාල ගාස්තු ගෙවීමෙන් පසු නිකුත්කරනු ලැබේ.මෙම ප්‍රසම්පාදන ලේඛන මෙම දිනවලදී කාර්යාල වේලාවන් තුළ අමාත්‍යාංශයේදී නොමිලේ පරික්ෂාකර බැලිය හැකිය.

**03.** සියලුම ලංසුකරුවන් එක් එක් පැකේජයන්ට අදාළව ඉදිරියෙන් සඳහන් ලංසු බැදුම්කර වටිනාකමට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි,පිළිගත් වාණිජ බැංකුවකින් **වගු අංක - 01 හි** තොරතුරු ඇතුළත්ව අදාළ දින දක්වා වලංගුවන පරිදි **ලේකම්,අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.සබරගමුව පළාත් සභාව. නව නගරය,රත්නපුර** නමින් අදාල ප්‍රසම්පාදන කාර්යයට අදාළව ලබාගත් ලංසු බැදුම්කරයක් හෝ ලංසු සුරක්ෂණ මුදල ලෙස **අමාත්‍යාංශ ලේකම් වෙත අදාළ මුදල් තැන්පත් කර ලබා ගත් රිසිට් පත , ලංසුව සමග ලංසු බැදුම්කරය ලෙස ඉදිරිපත් කළ යුතුය. ලංසු බැදුම්කරය ඉදිරිපත් කිරීමේ දී මුදල් ගෙවා ලබාගන්නා රිසිට් පතෙහි හෝ ලංසු සුරක්ෂණයෙහි මුල් පිටපත අනිවාර්යෙන්ම ඉදිරිපත්කළ යුතුය.**

වගු අංක **-01**

| විස්තරය | පැකේජ අංක - 01<br>(පරිගණක උපකරණ සැපයීම ) | පැකේජ අංක - 02<br>( දහම් පාසල් පුස්තකාල කබඩ් සැපයීම ) |
|---|---|---|
| ලංසු වලංගු කාලය | **2025.12.08** | **2025.11.25** |
| ලංසු සුරක්ෂණ වලංගු කාලය<br>( Bid Bond/ Guarantee ) | **2026.01.05** | **2025.12.17** |

04. සම්පූර්ණ කරන ලද ලංසු **2025.09.08** වන දින **පෙ.ව.11.00** ට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ** සබරගමුව පළාත් සභා සංකීර්ණයේ පළමු මහලේ පිහිටි **අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම** කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. **මිළ ගණන් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ පැකේජ අංකය හා අංකයට අදාළ ප්‍රසම්පාදන කාර්යයේ නම සඳහන් කළ යුතුය. සෑම ටෙන්ඩරයක් සඳහාම , අනුපිටපතක් ,ඒ බව කවරයේ සඳහන් කර වෙනම කවරයක බහා මුල් පිටපත සමඟ එක් කවරයකින් ඉදිරිපත් කළ යුතුය.**

**<u>ලංසු එවිය යුතු ලිපිනය :-</u>**

**ලේකම්**
**අධ්‍යාපන ,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**
**සබරගමුව පළාත් සභාව**
**නවනගරය**
**රත්නපුර.**

**05.ලංසු පත් විවෘත කිරීම 2025.09.08** වන දින **පෙ.ව.11.00** ට **සිදුකරනු ලබන අතර, ලංසු කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය** හැකිය.

**06.** මෙම ලංසු කැඳවීම සම්බන්ධයෙන් පැන නගින ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් කාර්යාල වේලාවන් තුලදී අවශ්‍ය විස්තර අමාත්‍යාංශ කාර්යාලයෙන් **දුරකතන අංක 045 -2222542, ෆැක්ස් 045-2228042 සහ**

**ඊමේල්** **edusabaram@gmail.com** මගින් ලබා ගත හැකිය. ටෙන්ඩර් පත් සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති සතු වේ.

**07. මෙම ප්‍රසම්පාදනයට අදාල පූර්ව ලංසු සාකච්ඡාව 2025.08.28 දින පෙ.ව.10.30 ට අධ්‍යාපන අමාත්‍යාංශ රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබේ. ලංසු කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැකිය.**

**08**. මෙම ලංසු කැඳවීම සම්බන්ධයෙන් පැන නඟින ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති සතු වේ.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
ලේකම්
අධ්‍යාපන,තොරතුරුතාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව,
නව නගරය, රත්නපුර
2025.08.15 දින.